# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1759/42 – 2012 මැයි 25 වැනි සිකුරාදා – 2012.05.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1983 මැයි මස 30 වැනි දින අංක 347/2 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 1983 අංක 136 දරන (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පල කරන ලද 1983 අංක 136 දරන ආඥාවේ සහ අංක 1058 දරන පිඹුරේ කැබලි අංක 171 යන ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/82එල්ජී/159.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කො. ප්‍රා. ලේ./03/05/01/04.
2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A – G 16086 – 450 (2012/05)

උපලේඛනය

සබරගමුව පළාත, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, දියපොටගම් පත්තුව සුළු කොට්ඨාසයේ, ගොඩවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම් පිඹුර 759 හා 1996.03.20 වැනි දින දරන සංශෝධිත මූලික පිඹුරේ කැබලි අංක 318 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.809ක් පමණ වන ගරාජ් එකේ වත්ත නමැති ඉඩම් කොටස් එකට (01) මායිම්:

01. **කැබලි අංක 318 – ගරාජ් එකේ වත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.809ක් පමණ**

උතුරට: කැබලි අංක 173; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 319; බටහිරට: කැබලි අංක 317.

06 - 419

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 61 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2011/ඩබ්එස්/309.
ඔබේ යොමු අංකය: ELI–CDP/SD/M/S2-2.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1750/25 හා 2012.03.22 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 2012 අංක 61 දරන ආඥාවේ 2ඒ පිටුවේ ඉඩමේ විස්තර යටතේ සඳහන් ඉඩමේ නම "කැබලි අංක 265, ශ්‍රී ධර්මාරාම පාරේ වරි. අංක 45/8, ප්‍රමාණය

හෙක්. 0.0003ක් පමණ" යන්න වෙනුවට "කැබලි අංක 265-අමුහකුජ්ජවත්ත වරි. අංක 45/8, ද මැල් පාර, 3 වැනි පටුමග, ප්‍රමාණය හෙක්. 0.0003ක් පමණ"යන්න ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 420

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1752/21 හා 2012.04.05 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2012 අංක 83 හා 2012.04.04 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩමේ කැබලි අංක 'බී' සහ 'සී' යන කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1752/21 හා 2012.04.05 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2012 අංක 83 හා 2012.04.04 වැනි දින දරන ආඥාවේ සඳහන් කැබලි අක්ෂර බී සහ සී මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/13/2012/සීඒ/46.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: එන්සීපී/වී/කේ/9/9/1/7.
2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
බත්තරමුල්ල.

#### උපලේඛනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ නව නගරය ගමේ පිහිටි පොළොන්නරුව කොට්ඨාස භාර මැණුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක PO/TK/2012/116 සහ 2012.03.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.9545ක් පමණ වන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි 02ට මායිම්:

01. **කැබලි අක්ෂර "බී" – රාජරූප කැලේ පට්ටියදමන මූකලාන – ප්‍රමාණය: හෙක්. 0.8212 ක් පමණ**
උතුරට: පරාක්‍රම සමුද්‍රය සඳහා වෙන් කළ කොටස සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ අ. ජ. පි. පො. 160හි 875 වැනි බිම් කැබැල්ල; දකුණට: අ. ජ. පි. පො. 160හි 875 වැනි බිම් කැබැල්ල සහ කොටස "ඒ"; බටහිරට: කොටස "ඒ" සහ පරාක්‍රම සමුද්‍රය සඳහා වෙන් කළ කොටස.

02. **කැබලි අක්ෂර "සී" – රාජරූප කැලේ පට්ටියදමන මූකලාන – ප්‍රමාණය: හෙක්. 0.1333 ක් පමණ**
උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ කැබලි අංක 875; දකුණට: කැබලි අංක 875 සහ අ. භූ. පි. 9 හි 1687 වැනි කැබැල්ල; බටහිරට: අ. භූ. පි. 9 හි 1687 වැනි කැබැල්ල.

06 - 421

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1986 අප්‍රේල් මස 02 වැනි දින අංක 395/8 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1986 අංක 97 දරන ආඥාවේ සඳහන් කැබලි අක්ෂර ඒ සිට ඒපී දක්වා සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියේ උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් පමණක් මෙමෙ නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/85/එම්/76.
දිසාපතිගේ යොමු අංකය: ඉ/12/2/අරලගංවිල/අත්පත්.
2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

#### උපලේඛනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාසයේ එගොඩ පත්තුව සුළු කොට්ඨාසයේ අරලගංවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පො/අ/85/04 දරන ප්‍රගමන අනුරේඛනයේ පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 2.054ක් පමණ වූ පහත සඳහන් බිම් කැබලි දෙක:

01. **කැබලි අක්ෂර "ආර්" – කොලොන්ගස් හන්දිය – ප්‍රමාණය: හෙක්. 1.131ක් පමණ**
උතුරට: මාර්ගය (ගම් සභා); නැගෙනහිරට: රජයේ ඉඩම්; දකුණට: කැබලි අක්ෂර එස්; බටහිරට: මාර්ගය (ගම් සභා).

02. **කැබලි අක්ෂර "ඒබී" – අරලගංවිල – ප්‍රමාණය: හෙක්. 0.923ක් පමණ**
උතුරට: රජයේ ඉඩම; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒඒ; දකුණට: කැබලි අක්ෂර ඒසී සහ රජයේ ඉඩම; බටහිරට: රජයේ ඉඩම.

06 – 422

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.